සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

2024 - 02 - 28

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# மேல் மாகாணக் கல்வித் திணைக்களம்
# Department of Education - Western Province

## වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
## ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
## Year End Evaluation - 2023 (2024)

65706

| ශ්‍රේණිය / தரம் / Grade | විෂයය / பாடம் / Subject | පත්‍රය / வினாத்தாள் / Paper | කාලය / காலம் / Time |
|---|---|---|---|
| 10 | සිංහල භාෂාව හා සාහිත්‍යය | I | පැය 1 යි |

නම / பெயர் / Name ..........................................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..........................

සැලකිය යුතුයි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

01. විභාග ප්‍රශ්න පත්‍රය අතට ලැබුණු විට **කජු කන්නා සේ** නිර්මලා පිළිතුරු ලිව්වාය.
(1) ඉතා ඉක්මනින් (2) ඉතා පහසුවෙන් (3) ඉතා සෝදිසියෙන් (4) ඉතා නිවැරදි ලෙස

02. දෙ පිරිස අතර වූ **කඹ ඇදීමේ** ප්‍රතිඵලයක් වශයෙන් මාර්ගයේ අලුත්වැඩියාව ඇණහිට ඇත.
(1) එකඟතාවක් නොමැතිකම නිසා (2) කඹ ඇදීමට ඇති ළැදියාව නිසා
(3) දෙ පැත්තට බෙදුණු නිසා (4) ආරවුලක් නිසා

03. අසාධාරණය ඉදිරියේ **කරබාගෙන සිටීම** තමන්ට නුපුරුදු බව හේ තරයේ පැවසීය.
(1) තර්ක කිරීම (2) කතාවට යාම (3) එකට එක කීම (4) නිශ්ශබ්දව සිටීම

- අංක 04 සිට 07 තෙක් ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

04. ශ්‍රී ලාංකික දෙමළ ජනයා තෛපොංගල් හැරුණු විට .......................... සමරන උත්සවය දීපාවලිය යි.
(1) උද්‍යෝගයෙන් (2) උපහාසයෙන් (3) උත්කර්ෂයෙන් (4) උපදේශයෙන්

05. දැනට ශ්‍රී ලංකාවේ හමු වූ පැරණිතම මැටි බඳුන් .......................... ලැබී ඇත්තේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති වරකාපොළ දොරවක කන්ද ගල් ලෙනෙනි.
(1) අතිවිශේෂ (2) විශේෂ (3) අවශේෂ (4) සුවිශේෂ

06. චිරන්තන සාහිත්‍යික උක්තීන් භාවිතයට ගන්නා නූතන සාහිත්‍යකරුවා උත්සාහ කරන්නේ .......................... යෙදුම් මගින් චමත්කාරයක් දනවීමට යි.
(1) ධ්වනිපූර්ණ (2) පරපෝෂිත (3) අවස්ථෝචිත (4) විස්මයාවහ

07. ලක් දෙරණ ආක්‍රමණිකයන්ගේ .......................... මුදවා ගැනීමට තම ධනදිය පමණක් නොව රුධිරය ද හෙළුවෝ බොහෝ වෙති.
(1) ජීවයෙන් (2) බැඳීමෙන් (3) වාසයෙන් (4) ග්‍රහණයෙන්

08. වර්ගාක්ෂරවල අවසාන තීරුවේ තිබෙන අක්ෂර පහ හැඳින්වීමට යෙදෙන නමක් නො වන්නේ,
(1) අනුනාසික අක්ෂර (2) අර්ධානුනාසික්‍ය අක්ෂර
(3) නාසික්‍ය අක්ෂර (4) වර්ගාන්ත අක්ෂර

- අංක 09 හා 10 ප්‍රශ්නවල සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

09. (1) ඉපැරණි - පිරිහුණු - විශ්මය - සමස්ථ (2) උච්ඡාරණය - පිළිබිඹු - වර්ණනාව - ආකර්ෂණ
(3) චිරස්ථායි - නිරායාශයෙන් - විශිෂ්ට - දේශගුණය (4) ශිෂ්ටාචාරය - සාම්ප්‍රදායික - විදග්ධ - පෘෂ්ඨය

10. (1) ප්‍රක්ෂේපණ - තාක්ෂණික - රෝපණය - පරිවර්තනය
(2) ප්‍රවීන - දණ්ඩනය - දර්ශනය - ප්‍රකාශන
(3) සණ්ටාර - අර්ණව - ධාරාණිපාත - උළෙල
(4) සියලු - නිශ්ශබ්ද - ප්‍රස්තාර - කණගාටුව

11. අර්ධ ස්වරයක් යෙදී නැති පදයක් සහිත වරණය තෝරන්න.
(1) යතුර - වතුර - කතුර - සිදුර (2) විල - ජල - නල - බල
(3) කියන - යවන - පිනන - රවන (4) රාවය - ජීවය - ප්‍රීතිය - භාවය

- අංක 12 හා 13 ප්‍රශ්නවල මුලින් දැක්වෙන අක්ෂර වර්ගයට අයත් අකුරක් නො යෙදුණු වචනය සහිත වරණය තෝරන්න.

12. (1) මහාප්‍රාණ - ඵලදායී, ධර්මිෂ්ඨ, සන්දර්භය, නිෂ්ඵල
(2) නාසික්‍ය - විඥ්ඥාණය, සුළඟ, සම්භාව්‍ය, වර්ධනය
(3) අල්පප්‍රාණ - ග්‍රන්ථය, වස්තුව, අර්බුදය, දුක
(4) සඤ්ඤක - කඹය, දඟරය, සඳහා, දඬුවම

13. (1) මූර්ධජ - සෘෂිවරයා, රාජකීය, ආමන්ත්‍රණය, ළපල්ල
(2) දන්තජ - තරණය, ධනය, ඉඩම, සරුසාර
(3) ඕෂ්ඨජ - උත්සවය, පිදුරු, බඹලොව, මන්දාරම
(4) කණ්ඨජ - කනිෂ්ඨ, ආදිත්‍ය, ගංගාව, රංගනය

14. පහත දැක්වෙන පදවල මුල් අක්ෂරවල ඇති පිල්ලම් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
රූපය - කිරණ - මුල්ල - ශීතල
(1) දීර්ඝ ඇදය - කෙටි ඉස්පිල්ල - කෙටි පාපිල්ල - දීර්ඝ ඉස්පිල්ල
(2) දීර්ඝ පාපිල්ල - කෙටි ඉස්පිල්ල - කෙටි පාපිල්ල - දීර්ඝ ඇදය
(3) දීර්ඝ ඇදය - දීර්ඝ ඉස්පිල්ල - කෙටි පාපිල්ල - දීර්ඝ පාපිල්ල
(4) දීර්ඝ පාපිල්ල - කෙටි ඉස්පිල්ල - කෙටි පාපිල්ල - දීර්ඝ ඉස්පිල්ල

15. උක්ත නාමපද පමණක් යෙදී ඇති පිළිතුර තෝරන්න.
(1) තොපි - ගොවියන් - සිටුවරයා - නුඹලා
(2) අපි - මිනිස්සු - ගායිකාවක - සංචාරකයෝ
(3) තොපි - කුරුල්ලෝ - තරුණියෝ - ලේඛකයෙක්
(4) ඔබ - දෙවියෙකු - ගුරුවරු - මැතිතුමා

16. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නො දෙන පදයක් සහිත පිළිතුර තෝරන්න.
(1) ස්තූපය - චෛත්‍යය, දාගැබ, සෑය, චේතිය (2) කන්ද - ගිර, පව්ව, කුල, පර්වතය
(3) ගෘහය - ගෙය, මාලිගාව, ඝරය, නිවාසය (4) සාගරය - සයුර, මුහුද, සිඳු, රුවනාර

17. මුලින් දැක්වෙන ක්‍රියාපද වර්ගයට නො ගැළපෙන පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) අසම්භාව්‍ය ක්‍රියා - යද්දී, බැලුවොත්, කැවොත්, බසිද්දී
(2) විධි ක්‍රියා - බොනු, හිඳිව්, එන්න, බලනු මැනවි
(3) මිශ්‍ර ක්‍රියා - කකා, එමින්, සෙමින්, රකිමින්
(4) පූර්ව ක්‍රියා - ලියා, කියා, නා, ගොස්

18. විරුද්ධාර්ථවත් පද යුගලයක් නො වන පිළිතුර තෝරන්න.
(1) ආගන්තුක - නේවාසික (2) ජනශූන්‍ය - ජනාකීර්ණ
(3) ස්වාධීන - පරාධීන (4) උතුම් - දුර්ලභ

19. යුගල පදයක් නො වන පදයක් දැක්වෙන වරණය තෝරන්න.
(1) ලේසි - පාසු, උදව් - පදව් (2) ගමේ - ඉමේ, තුටු - පහටු
(3) ඉඳුම් - හිටුම්, අරුම - පුදුම (4) තැගි - බෝග, ගනු - දෙනු

20. "සතතාභ්‍යාසය" යනු,
(1) නිරන්තරයෙන් අභ්‍යාසයේ යෙදීම යි. (2) විශේෂ අභ්‍යාසයක යෙදීම යි.
(3) හදිසි අභ්‍යාසයක යෙදීම යි. (4) සත්‍ය අභ්‍යාසයක යෙදීම යි.

21. නිවැරදි ව අර්ථ ගලපා ඇති පිළිතුර තෝරන්න.
(1) පරිශීලනය - වැඩුණු (2) ආකස්මික ව - ඇසුරු කිරීම
(3) අනාවරණය - වැසුණු (4) ව්‍යසනය - කරදරය

22. "රොස් කොට" යනු,
(1) කෝප වී (2) රැස් වී (3) මහත් වී (4) පහත් වී

23. "සාහිත්‍යයක ගැබ් වන ප්‍රතිභාවෙන් සාහිත්‍යකරුගේ ප්‍රතිභාව මෙන් ම සාහිත්‍ය රසිකයාගේ ප්‍රතිභාව ද මැනිය හැකි ය." මෙම වාක්‍යයෙහි "ප්‍රතිභාව" යන්නෙන් අදහස් කෙරෙන්නේ,
(1) නැවත සකස් කොට දැක්වීම යි. (2) අපූර්ව වස්තුවක් නිර්මාණය කිරීමේ හැකියාව යි.
(3) කතාව ඉදිරිපත් කිරීමට අනුගමනය කරන ශෛලියයි. (4) අලුතින් කතාවක් නිර්මාණය කිරීම යි.

24. මුලින් දී ඇති ව්‍යාකරණ විධියට නිවැරදිව ගැළපෙන පද සහිත පේළිය තෝරන්න.
(1) නාම ප්‍රකෘති - කුමර - වඳුරා - ගස් - පුටු (2) ධාතු ප්‍රකෘති - බල - ගය - තබ - කප
(3) නිපාත - යළි - වෙනුවෙන් - රට - සේක (4) උපසර්ග - සුකුමාර - දුදන - ඥානය - අවපස

25. වැරදි අදහස සහිත වාක්‍යය කුමක් ද?
(1) යම් ප්‍රකාශයක් වඩාත් පැහැදිලි කිරීමෙහි දී සරල වරහන යෙදේ.
(2) අතීත කෘදන්ත රූපවල යෙදෙනුයේ මූර්ධජ "ණ" කාරය යි.
(3) උපමාවක් දැක්වීමේ දී මෙන් - සේ - වැනි - බඳු ආදී උපමාරූපී නිපාත පද නො යෙදේ.
(4) ප්‍රශ්නවාචී යෙදුමකින් අවසන් වන වාක්‍යයක යෙදෙන කර්තෘ වාචක පදය අනුක්ත ස්වරූපය ගනී.

26. වැරදි ලෙස විසන්ධි කර ඇති පදයක් සහිත වරණය තෝරන්න.
(1) සුර + අක / දඬ + කම් (2) ගුණ + අගුණ / හෙළ + ඕ
(3) මහ + ඉසිකා / මුගු + ඇට (4) දව + කල් / ගඟ + පොළ

27. නිවැරදිව ගැළපෙන පිළිතුර තොරන්න.
(1) පූර්ව රූප සන්ධිය කම්මල - දුප්පත් (2) ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය වළංදෙක - තුනුවග
(3) ස්වර සන්ධිය නිලුපුල් - දකුණත (4) ස්වරාදේශ සන්ධිය දැත - කඩුවෙන්

28. පහත දී ඇති ප්‍රාදේශික ව්‍යවහාර හා බැඳුණු සාමාන්‍ය ව්‍යවහාර වැරදි ලෙස යොදා ඇති වරණය තෝරන්න.
(1) දොරං - දොරවල් , වපුරච්චා - වැපුරුවා (2) බාප්පොච්චි - බාප්පා , කුදහච්චා - නිදාගත්තා
(3) දුටා - දැක්කා , පුන්නච්චා - නිදිකෙරුවා (4) පොල් කටුව - පොල් කට්ට - කොකිස් - කැවිලි

29. වැරදි ගැළපුම කුමක් ද?
(1) පරෙවි සන්දේශය - ගුරුළුගෝමී පඬිතුමා (2) සැළලිහිණි සන්දේශය - තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමි
(3) මයුර සන්දේශය - කවීශ්වර පඬිතුමා (4) හංස සන්දේශය - වීදාගම මෛත්‍රිය මාහිමි

30. පහත (අ) සහ (ආ) කොටස් යටතේ දැක්වෙන චරිත හා නිර්මාණ නිවැරදි ව ගැළපෙන වරණය තෝරන්න.

| (අ) | | (ආ) |
|---|---|---|
| 1. යසෝමා | A - | සුනේත්‍රා |
| 2. සේනාධීර | B - | විජය බා කොල්ලය |
| 3. අසංග | C - | හුණුවටයේ කතාව |
| 4. නටාලියා | D - | මං තනන්නෝ |

(1) D A B C (2) A D B C (3) B A C D (4) D B C A

31. හල්දුම්මුල්ල හා උඩරංචාමඩම නමැති ගම්මානවලින් හමු වී ඇත්තේ,
(1) පැරණි ජනාවාසවල නටබුන් ය. (2) පැරණි නිවාසවල නටබුන් ය.
(3) පැරණි විහාරස්ථානවල නටබුන් ය. (4) පැරණි බුදු පිළිමවල නටබුන් ය.

32. "තොරොක්කෝව" කෙටි කතාව උපුටාගෙන ඇත්තේ,
(1) රවුන් බන්දුජීව මහතාගේ මීලඟ මීවිත කෘතියෙනි.
(2) රත්න ශ්‍රී විජේසිංහ මහතාගේ වස්සානේ කෘතියෙනි.
(3) ජයන්ත විමලසේන මහතාගේ හදවත පාළුයි කෘතියෙනි.
(4) පරාක්‍රම කොඩිතුවක්කු මහතාගේ අකීකරු පුත්‍රයකුගේ ලෝකය කෘතියෙනි.

- අංක 33 සහ 34 ප්‍රශ්නවල දී ඇති ප්‍රස්තාව පිරුළුවල වඩාත් ගැළපෙන අදහස ඇති වරණය තෝරන්න.

33. අතු කඩා මොර කන්නා සේ
(1) නො සැලකිලිමත් ලෙස ක්‍රියා කිරීම.
(2) ගසක් විනාශ කර ඵල නෙළා ගැනීම.
(3) තමාගේ කාර්යය ගැන පමණක් සිතා කටයුතු කිරීම.
(4) අය මාර්ග මුළුමනින් ම විනාශ කර දැමීම.

34. එපා වාහෙට හොඳි බෙදන්නා වාගේ.
(1) එපා වන විදියට කටයුතු කිරීම.
(2) පිළිකුලෙන් හා නො සැලකිල්ලෙන් සැලකීම.
(3) අනවශ්‍ය පරිදි උදව් කිරීමට යාම.
(4) අනුන්ට හොඳි බෙදන්නට නො දැනීම.

- අංක 35 36 37 ප්‍රශ්නවල දී ඇති වාක්‍ය අතුරෙන් ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.

35. (1) ඕ තොමෝ ගමට ගමට ගියහ.
(2) ගුරුවරු හොඳින් උගන්වනු ඇත.
(3) අපි සියල්ලන් ම ශ්‍රී ලාංකිකයන් වෙමු.
(4) දක්ෂ ක්‍රීඩිකාවක වන්නේ කෙසේ ද?

36. (1) ඔවුහු එය වටහා ගැනීම වටී.
(2) නුඹලා අනාගත නායකයන් වූ.
(3) සියලු මිනිසුන් සත්‍යගරුක විය යුතු ය.
(4) මා විසින් නුඹ රකින ලදී.

37. (1) අසෝක රජතුමා දැහැමි පාලකයෙක් විය.
2. ඔහු දක්ෂ ලේඛකයෙකු වෙයි.
(3) මා මහණ දම් පිරිය යුත්තෙමි.
4. සොරුන් දෙදෙනෙක් ගෙවල් බින්දා හ.

- අංක 38 සහ 39 ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම සඳහා පහත දී ඇති පද්‍යය හොඳින් කියවන්න.

උදුල සොමි කැලුම් නිසයුරු හිමි පුවල
පහළ වන බැවින් තම වෙත නිසඹු දොළ
ලකළ ගුවන් තල සිරි යහන තිකසළ
අතුළ කුසුම් විලසින් සැදෙන තුරුවැළ

38. ඉහත පද්‍යයෙන් වර්ණනා කෙරෙන්නේ,
(1) උදෑසනක් ය. (2) සන්ධ්‍යා කාලයක් ය. (3) දිවා කාලයක් ය. (4) අහස් තලය ගැන ය.

39. මෙම පද්‍යය අන්තර්ගත වන සැළලිහිණි සන්දේශය රචනා කර ඇත්තේ,
(1) කුරුණෑගල යුගයේ දී ය.
(2) මහනුවර යුගයේ දී ය.
(3) කෝට්ටේ යුගයේ දී ය.
(4) ගම්පොළ යුගයේ දී ය.

40. පහත දැක්වෙන වාක්‍යයේ අදහසට වඩාත් සමීප අදහස දැක්වෙන පිළිතුර තෝරන්න.
ජලාශ්‍රිත භූමියෙහි සිදු කෙරුණු වී ගොවිතැන ළඟට සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයෙහි වැදගත් වන්නේ 'හේන් ගොවිතැන' යි.
(1) ජලය සහිත බිමක වී ගොවිතැන මෙන් ම හේන් ගොවිතැන ද සාර්ථක ව සිදු කෙරේ.
(2) ජලාශ්‍රිත ව සිදු කෙරෙන වී ගොවිතැන මෙන් ම සාම්ප්‍රදායික කෘෂි කර්මාන්තය ද සිදු කෙරේ.
(3) ජලය සහිත බිමක වී ගොවිතැන මෙන් ම ඊළඟට වැදගත් වන්නේ හේන් ගොවිතැන යි.
(4) වී ගොවිතැන සහ හේන් ගොවිතැන සාම්ප්‍රදායික කෘෂි කර්මාන්තයේ දී වැදගත් වේ.

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2024 . 02 . 28

De Mazenod College Kandana 65750

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)**
**Year End Evaluation - 2023 (2024)**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: **සිංහල භාෂාව හා සාහිත්‍යය** | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 2 යි |

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

1. අංක (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) සිංහල අක්ෂර මාලාවෙහි ඇතුළත් වන පහත සඳහන් අක්ෂර කාණ්ඩ දෙක නම් කරන්න.
(අ) ත, ඪ, ද, ධ, න (ආ) ඟ, ඦ, ඬ, ඳ, ඹ

(ii) මෙම වාක්‍යවල අක්ෂර වින්‍යාසය සදොස් වචන පමණක් නිදොස් කර ලියන්න.
(අ) ප්‍රවෘත්ති පත්‍රයේ පළ වූ පරිගනක විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රීය ලිපි ලේඛනවලට කවුරුත් ප්‍රශංසා කළහ.
(ආ) වාර්ෂික වාර්ථාව සංශෝධනය කිරීමට ලේකම් එකග විය.

(iii) පහත දක්වා ඇති වචනවල යටින් ඉරි ඇඳි අකුරේ යෙදී ඇති පිල්ලම් නම් කරන්න.
(අ) <u>ගෘ</u>හස්ථ (ආ) <u>ඖ</u>ෂධීය

(iv) පහත දැක්වෙන සන්ධි පද විසන්ධි කරන්න.
(අ) පුනරුත්පත්ති (ආ) කවීන්ද්‍ර

(v) පහත දැක්වෙන පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍ය වෙන්කොට ලියන්න.
(අ) වැද්දා (ආ) නිපුණත්ව

(vi) ඉරි ඇඳි පදවල ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) ස්වාමිනි, දනට <u>වඩිනු මැනවි</u>. (ආ) වර වෙණ නද <u>අසමින්</u> සිත සතොසිනි.

(vii) වන මැද වැඩුණු සුවිසල් ගස්වල කුරුල්ලෝ ඉතා අලංකාර කූඩු සාදති.
(අ) නිපාත පදයක් (ආ) උපසර්ග පදයක් ලියන්න.

(viii) පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.
(අ) විනිසුරුවෝ බයිසිකල් සූරයන් තෝරති.
මෙම කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න.
(ආ) ආර්ථික විද්‍යාඥයන් විසින් නව ආර්ථික ක්‍රමයක් සැලසුම් කරන ලදී.

(ix) පහත දැක්වෙන කියමන් සඳහා ගැළපෙන පිරුළු ලියන්න.
(අ) අකමැත්තෙන් යම්කිසි කාර්යයක් සිදු කිරීම.
(ආ) තවත් කෙනෙකුගේ උපකාරයෙන් තමන්ගේ කටයුතු කර ගැනීම.

(x) පහත දැක්වෙන යෙදුම් සඳහා වී ගොවිතැන හා හේන් ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයෙහි යෙදෙන වචන ලියන්න.
(අ) කුරුල්ලන්ට කෑම පිණිස වෙන්කරන කුඹුරු කොටස
(ආ) හේන් ගිනිලෑමෙන් පසු ලැබෙන ප්‍රථම වර්ෂාව

(ලකුණු 2x10=20 යි)

2. පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 ට නො අඩු වන සේ රචනයක් ලියන්න. එක් එක් විස්තරයට මුලින් වරහන් තුළ ඇති අකුර ප්‍රශ්න අංකය සමග ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. (ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.)

(අ) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා හඳුන්වා දුන් නිදහස් අධ්‍යාපන ක්‍රමයේ ප්‍රතිඵල අපි අද භුක්ති විඳිමු. මෙසේ නිදහස් අධ්‍යාපනය යටතේ නොමිලයේ පොත් පත්, ඇඳුම් පැළඳුම් පාසල් ගොඩනැගිලි, විද්‍යා උපකරණ, පුස්තකාල පහසුකම් මෙන් ම සමහරුන්ට ශිෂ්‍යාධාර ද ලැබේ. මෙසේ නිදහස් අධ්‍යාපනයෙන් පෝෂණය වී උගතෙකු වූ විට තමාට උණුසුම දුන් ලක් මැණියන් අතහැර විදේශගතව තමා ලැබූ දැනුම ඒ රටවලට නොපැකිලි ව බෙදා දෙන්නේ කෙලෙහිගුණ නොදත්තකු මෙනි. මෙරට රැඳිය යුතු වූ බුද්ධිමත් සම්පත් විදේශගත වීම රටේ සංවර්ධනයට මහත් බාධාවකි. එබැවින් අනාගත පරපුර එසේ නොවීමට වගබලා ගැනීම රජයේ මෙන් ම අප සැමගේ වගකීමයි.

(ආ) පුරාණයේ ආගම දහමින් පෝෂණය ලැබූ ශ්‍රී ලංකාව නිදහස් සාමකාමී සහජීවනයෙන් කටයුතු කළ රටකි. එකල ශ්‍රී ලංකාව හැඳින්වූයේ 'දහම් දීපය' යන නමිනි. ඉන් ගම්‍ය වන්නේ විනය ගරුක සදාචාරවත් සමාජයක් අපට තිබූ බවයි. ගෝලීයකරණයත් සමඟ මුළු මහත් සමාජය ම තරගකාරී රටාවකට පිවිස ඇත. විනයගරුකවීමට නීති ක්‍රියාත්මක කිරීමට තරම් සමාජය පරිහානියට ගොස් තිබේ. මේ සඳහා නිවස, පාසල, මාධ්‍ය වගකීමෙන් යුතුව කටයුතු කළහොත් විනයගරුක සමාජයක් යළි ගොඩනැංවීමට හැකි වනු ඇත.

(ඉ) කියවීමේ අගය පිළිබඳව ඈත අතීතයේ සිට ම විවිධ ප්‍රකාශ අසන්නට ලැබේ. ඒ ප්‍රකාශ, ඒ අගනා කියමන් මුළු ලොව ම පිළිගෙන ඇත. එහෙත් වර්තමානයේ ළමා පරපුර මෙන් ම වැඩිහිටියන් ද විද්‍යුත් මාධ්‍යයන්ට ඇබ්බැහි වීම නිසා කියවීමේ පුරුද්දෙන් ටිකෙන් ටික ඈත් වෙමින් පවතී. ඒ සඳහා කළ යුත්තේ විද්‍යුත් මාධ්‍ය තුළින් සම්පූර්ණයෙන් ඉවත්වීම නො ව නවීන ලොවට ගැළපෙන විද්‍යා තාක්ෂණික දැනුම මෙන් ම තම ජීවිතයට අවශ්‍ය යහගුණ ද, රසාස්වාදය ද ලබා ගත හැකි හරවත් පොත පත කියවීමට රුචියක් දරුවන් තුළ ඇති කිරීමයි.

(ඊ) ජංගම දුරකථනය අද වන විට එහි ප්‍රධාන කාර්යය වන ඇමතුම් ලබා ගැනීම පමණක් නොව අන්තර්ජාලය භාවිතයෙන් මුලු ලෝකය ම ඇඟිලි තුඩු අතරට ළඟා කරවන බහු කාර්ය, විස්මය දනවන උපකරණයක් බවට පත් වී හමාර ය. එමෙන් ම දැනුම සපයන මෙවලමක් පමණක් නො ව එදිනෙදා කටයුතු පහසු කරවන උපකරණයක් ද වී ඇත. එහෙත් වර්තමානයේ මෙම උපකරණය නිසි ලෙස, අදාළ පරිදි, භාවිත නො කිරීමෙන් දිනෙන් දින වැඩිවන අයහපත් ප්‍රතිඵල බොහෝ ය. එබැවින් ජංගම දුරකථනය අවභාවිතයෙන් වැළකී යහපත සඳහා යොදා ගැනීම කෙරෙහි සියලු දෙනාගේ ම අවධානය යොමු විය යුතු ය.

(ලකුණු 25 යි)

3. පහත දැක්වෙන ඡේදය වචන 55 - 60 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

කිසියම් වින්දනයක් ලබාදෙන නිර්මාණාත්මක ලේඛනගත සියලු දේ මෙන්ම මුඛ පරම්පරානුසාරයෙන් පැවත එන ජනවේද, 'සාහිත්‍යය' නමින් හැඳින්වේ. සියලු සාහිත්‍යාංග 'කාව්‍ය' ලෙස සංස්කෘත අලංකාරියෙ හැඳින්වූහ. සිංහල ලේඛකයන් හා කවියන් සංස්කෘත සාහිත්‍යයෙන් ද විචාර සිද්ධාන්තයන්ගෙන් ද ආභාසය ලද නමුත් ඔවුන් කාව්‍ය යන්න පද්‍යයට ම ආරෝපණය කළ බව පෙනේ. සිංහල කවියා ද රසිකයා ද කාව්‍ය යයි කියන්නේ පද්‍යයට ය. සාහිත්‍ය නිර්මාණ අතරින් කවිය හෙවත් කාව්‍යයට විශේෂ ස්ථානයක් හිමි වේ. අත්දැකීම් හා බැඳුණු වින්දනාත්මක හැඟීම් වෙළාගත් සිතුවිලි, බස් වහර හා රිද්මය සමඟ කැටි කළ නිර්මාණය කාව්‍යයයි. ජීවිතයේත් පරිසරයේත්, මුහුණ දෙන විවිධ සංසිද්ධිවල දී පුද්ගල මනස සංවේදී වෙයි. බසේ ජීවය නොහඳුනන්නෝ බස හැසිරවීමේ ශක්තියෙන් හීන බැවින් සිය වින්දනය, රසවත් නිර්මාණයක් කිරීමට අපොහොසත් වෙති. බසේ ජීවය හඳුනන්නෝ බසත් රිද්මයත් මනා ලෙස ගළපමින් තම ප්‍රතිභා ශක්තියෙන් තමා ලද වින්දනාත්මක හැඟීම් රසවත් නිර්මාණයක් බවට පත් කරති. එසේ රමණීය අදහස් හා අරුත් දැනවෙන පරිදි කවි නිර්මාණය කරන්නේ කවියා ය. සැම ප්‍රතිභා සම්පන්න කවියෙක් ම රසිකයා ගේ මනෝභාවයන් පුබුදු කිරීමට උත්සුක වෙයි. ඒ සඳහා රමණීය කාව්‍ය නිර්මාණ සඳහා හැඟීම් දනවන අයුරින් භාෂාව භාවිත කළ යුතු වේ. එහෙත් සිතෙහි උපදින භාවයන් ඒ සැටියෙන් ම ප්‍රකාශ කිරීමට භාෂාවේ වචන ම ප්‍රමාණවත් නොවේ. කවියේ අර්ථයෙන් ප්‍රකාශ කරන හැඟීම්, පද සංඝටකයෙන් නගින හඬ වහල් කර ගැනීමෙන් උද්දීපනය කෙරේ. සමස්තයක් ලෙස ගත් කල උසස් පද්‍යයක අර්ථ රසය හා ශබ්ද රසය එකිනෙක වෙන් නොකළ හැකි ලෙස ඒකාබද්ධව පවතී.

(ලකුණු 10 යි)

4. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිනිසා භාෂාව නමැති මාධ්‍යය නිපදවා ගත්තේ අදහස් උදහස් හුවමාරුකොට ගැනීම පිණිස යි. භාෂාව සන්නිවේදන මාධ්‍යයකි. අන්‍යෝන්‍ය සම්බන්ධතාව පවත්වා ගැනීම උදෙසා අපට අවශ්‍යම දෙයකි සන්නිවේදනය. මෙය ඉතා සරලව පැවසුවහොත් කෙනෙකුගෙන් තවත් කෙනෙකුට තොරතුරු යැවීම සන්නිවේදනය යි. සන්නිවේදනය මිනිසාට පමණක් සීමා වූවක් නොව තිරිසන් සත්තු ද සන්නිවේදනයේ යෙදෙති. සත්ත්ව සන්නිවේදනය මානව භාෂාවෙන් කෙරෙන සන්නිවේදනය තරම් ප්‍රබල නොවේ. අපගේ ඕනෑ එපාකම් වටපිටාව සමග සංවිධානය කර ගැනීම උදෙසා සන්නිවේදනය ප්‍රබල මෙහෙයක් ඉටු කරයි. සන්නිවේදන කාර්යයක් සාර්ථකව සිදුවනුයේ සන්නිවේදකයා සහ ලබන්නා අතර අන්‍යෝන්‍ය අවබෝධයක් තිබුණු විටයි. මිනිසාගේ සන්නිවේදනය භාෂාවට පමණක් සීමා නො වේ. ඔහු භාෂාවට අමතර ව තවත් නොයෙක් මාර්ගවලින් අදහස් ප්‍රකාශ කරයි. මිනිසාට තමාගේ ශරීරයේ පිහිටි අවයව චලනය කිරීමෙන් අදහස් ප්‍රකාශ කළ හැකි ය. දරුවන් සමග සන්නිවේදනයේ දී වඩාත් වැදගත් වනුයේ භාෂාවයි. කියවීම, ලිවීම, සවන්දීම, කතාබහ යන භාෂා කාර්යයන් අතරින් දරුවන් සමග සන්නිවේදනයේ දී වැදගත් වන්නේ සවන්දීම හා කතා බහයි. ළමයා ජීවිතයෙන් ඉගෙනුම ලබයි. දරුවන් නිරතුරුව ම දෙමාපියන් ගැන දැඩි අවධානයෙන් පසුවන අතර ම ඔවුන්ගේ චර්යාවන් හා කතාබහ ද දරුවන්ගේ හැසිරීම් කෙරෙහි නො මඳ බලපෑමක් ඇති කරයි.

(i) ඡේදයට අනුව සන්නිවේදනය යනු කුමක් ද?
(ii) සාර්ථක සන්නිවේදනයක් සඳහා තිබිය යුත්තේ කුමක් ද?
(iii) භාෂාව හැර සන්නිවේදනය කළ හැකි වෙනත් මාර්ගයක් නම් කරන්න.
(iv) ඡේදයේ සඳහන් පරිදි භාෂා කාර්යයන් මොනවා ද?
(v) දරුවන් සමග සන්නිවේදනයේ දී වඩාත් වැදගත් වන්නේ කුමක් ද?

(ලකුණු 2×5=10 යි)

5. රුවන්පුර, විල්දෙණිය ගම් ප්‍රදේශය හරහා වැටී ඇති මාර්ගය වසර ගණනාවක සිට ඉතා අබලන් ව පවතී. මේ හේතුවෙන් ප්‍රදේශවාසීහු මුහුණ දෙන ගැටලු පිළිබඳ දන්වමින් විල්දෙණිය ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත යැවීමට ලිපියක් සකස් කරන්න. ඔබ විල්දෙණිය ප්‍රජා සංවර්ධන සමිතියේ ලේකම් යැයි සිතන්න.
(වචන 100 - 125 ක් පමණ සෑහේ)

නැතහොත්

පහත දක්වෙන තොරතුරු ඇසුරු කර ගනිමින් නුවරඑළියේ පුබුදු මල් ප්‍රදර්ශනාගාරයේ පැවැත්වෙන ප්‍රදර්ශනය පිළිබඳ පුවත්පත් දැන්වීමක් සකස් කරන්න. (වචන 100 ක් පමණ සෑහේ)

- ⋆ මල් පැළෑටි, බද්ධ කළ පලතුරු පැළෑටි ප්‍රදර්ශනය හා අලෙවිය
- ⋆ පොහොර වර්ග, කෘමිනාශක, මැටි හා ප්ලාස්ටික් මල් බඳුන් සහන මිලට
- ⋆ 25% වට්ටම්, උපදේශන සේවා
- ⋆ ප්‍රදර්ශනය සතියක් පුරා
  2024 - 03 - 01 ආරම්භය
  පෙ. ව. 9.00 - 12.00, ප. ව. 2.00 - රාත්‍රී 9.00
- ⋆ සංවිධානයː- නුවරඑළිය "සරසි" මල් සංවිධානය විසිනි.

(ලකුණු 15 යි)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

28-02-2024



වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

65821

| ශ්‍රේණිය / தரம் / Grade | විෂයය / பாடம் / Subject | පත්‍රය / வினாத்தாள் / Paper | කාලය / காலம் / Time |
|---|---|---|---|
| 10 | සිංහල භාෂාව හා සාහිත්‍යය | III | පැය 2 යි |

සැලකිය යුතුයි:- ■ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
■ 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
■ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "එවිට අප සිත් වූ පරිද්දෙන් සතුරන්ට කටයුතු කියම් හ"
(අ) මෙම ප්‍රකාශය ඇතුළත් කෘතිය කිනම් රජ දවස සිංහලයට නැගුණේ ද?
(ආ) මෙසේ කීවේ කවුරුන් ද?

(ii) සුන් එ තතින් එ සඳ
..............................................
දියුණු දියුණු ව නඳ
නික්ම පැතිරෙත දසත විනිවිඳ

(අ) මෙහි හිස්තැනට අදාළ පද්‍ය පාදය ලියන්න.
(ආ) මෙම පද්‍ය කාව්‍යය රචනා කළේ කවුරුන් විසින් ද?

(iii) (අ) සිංහල භාෂාව සමග බැඳී පවත්නා සාහිත්‍යාංග දෙක දක්වන්න.
(ආ) ජනකවි විවිධ විරිත් අනුව නිර්මාණය වීමට බලපෑ ප්‍රධාන කාරණය කුමක් ද?

(iv) (අ) එච්. එම්. කුඩලිගමගේ කවියාගේ නිර්මාණ බුදු සමයෙන් පෝෂිත එකක් වීමට බලපෑ කරුණ ලියන්න.
(ආ) එතුමා විසින් රචිත කාව්‍ය ග්‍රන්ථයක් නම් කරන්න.

(v) (අ) ජාතික වීර කාව්‍යයක් බවට පත් වී ඇති දීර්ඝ කාව්‍ය පන්තිය නම් කරන්න.
(ආ) ටිබෙට් රටේ සිකිම් දේශයේ උපන් කුඩා තෂි ලංකාවට පැමිණියේ කවුරුන් සමග ද?

(vi) "නගරයේ දූලක් මෙන් ඒ මේ අත වැටී තිබුණු පටු පාරවල් ඇගේ භ්‍රාන්තිය දියුණු කැරවී ය"
(අ) මෙහි "ඇගේ" යනුවෙන් දැක්වෙන්නේ කවුරුන් පිළිබඳව ද?
(ආ) මෙහි සඳහන් නගරයේ නම ලියන්න.

(vii) (අ) ගුත්තිල ඇඳුරුතුමා ජීවත් වූ නගරය කුමක් ද?
(ආ) ජාතක කථා ඇසුරෙන් රචිත ගී කාව්‍යයක් නම් කරන්න.

(viii) "අවට ලෝකය ඉතා රමණීය වේ. කිසිදු බියක් සිතට නො නැගේ"
(අ) මෙසේ ප්‍රකාශ කළේ කවුරුන් ද?
(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් නිර්මාණයේ රසෝද්දීපනය සඳහා උපයුක්ත වූයේ කුමක් ද?

(ix) පහත කෘතිවල කතුවරුන් නම් කරන්න.
(අ) කල්පනා ලෝකය
(ආ) ලංකා මාතා

(x) (අ) පුංචි මැණිකාගේ නිවුන් සෙහොයුරියගේ නම කුමක් ද?
(ආ) වනගත පරිසරය පසුබිම් කර ගනිමින් ඒ. පී. ගුණරත්න මහතා සිංහලයට නැගූ වෙනත් කෘතියක් නම් කරන්න.

(ල. 2 x 10 = 20)

Training Resource Center
R
De Mazenod College
Kandana

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) පුර දියවක යහපත් දවස් සඳ බලන්නට එක් සිත් වැ එක දිසාව බලන්නවුන් පරිද්දෙන් පැඳුම් දිග බලා සිටියහ"

(අ) මේ කුමන අවස්ථාවක් හා සම්බන්ධ වූවක් දැයි කෙටියෙන් දක්වන්න.

(ආ) අංකිත පදවල අර්ථය ලියන්න.

(ii) "ආරච්චිරාලගේ මරණයෙන් පසුව ආරච්චි හාමිනේ- නැංචො හාමි ගම හැර යන්නට තීරණය කර ගත්තා ය."

(අ) ඇය එසේ ගම හැර යන්නට තීරණය කිරීමට හේතු වූ කරුණු දෙකක් ලියන්න.

(ආ) ගම හැර ඇය ගියේ කිනම් ප්‍රදේශයකට ද?

(iii) දිමුතු යසස් වන් කුසුම සරාගේ
නුමුතු සුවඳ මල් පැළඳ සරාගේ
දකුතු රඟන සුරඟන රඟ ලාගේ
උමතු නො වෙද කෙලෙසක සිත කාගේ

(අ) අංකිත පදවල අර්ථය ලියන්න.

(ආ) මෙහි අවසන් පද්‍ය පාද දෙකේ අර්ථය ලියන්න.

(iv) හිරිමල් සිනා රැලි පෙණ පිඬු මිහිරි තම
ගල් පරවල ම හැපි හැපි බිහිකරමි මම
සම තැනිතලාවල හමුවෙයි අලසකම
නිරසයි අතරමග අවහිර නුදුටු බිම

(අ) මෙහි ඇතුළත් කාව්‍යාලංකාරයක් උදාහරණ සහිතව ලියන්න.

(ආ) පද්‍යයේ අවසන් පේළියෙන් හැඟවෙන අදහස ලියන්න.

(v) හෙණයක් සේ පතිත වූ අහසින්
හිස මතට දෙදරුම් දී
බමබා ම ඉඳුරන් අඳුරු කරමින්
පහරිනා රුදුරු
කිම ද නොකියා යන්ට කාරණා...

(අ) මෙහි දැක්වෙන පරිදි නොකියා යන්ට ගියේ කවුරුන් ද?

(ආ) මෙම පද්‍ය කොටසේ අර්ථය පැහැදිලි කර ලියන්න.

(ල. 5 x 4 = 20)

3. උම්මග්ග ජාතකයේ එන මහෞෂධ පණ්ඩිතයන්ගේ

(i) දූරදර්ශී බව හා

(ii) උපාය කෞශල්‍යය

හේතුවෙන් මිථුලු නුවර සතුරු ආක්‍රමණයෙන් ආරක්ෂා විය. නිර්දිෂ්ට කොටසින් උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 15)

නැතහොත්

ගුත්තිල ආචාර්යවරයාගේ වීණා නාදයේ මිහිරියාවෙන් මත් වූ

(i) සතුන්ගේ ස්වභාවයත්

(ii) සුරඟනන්ගේ රැඟුමත්

මනා අවස්ථා නිරූපණයක් බවට පත් කිරීමට කතුවරයා ගත් වෙහෙස අතිශයින් සාර්ථක වී ඇත. නිර්දිෂ්ට කොටසින් උදාහරණ දෙක බැගින් දක්වමින් මෙය සනාථ කරන්න.

(ලකුණු 15)

4. බැද්දේගම නවකතාවේ එන පුංචි මැණිකාගේ චරිතයෙන් දක්වෙන

(i) ජීවත් වීමට ගන්නා උත්සාහයත්

(ii) බබුන්ගේ පැමිණීම ගැන බලාපොරොත්තුවෙන් ක්‍රියා කිරීමත් හේතුවෙන් පාඨක සිත දයානුකම්පාවෙන් පිරී යයි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් මෙම ප්‍රකාශය තහවුරු කරන්න. (ලකුණු 15)

නැතහොත්

අවවාද අනුශාසනා දීමේ දී ජනකවියා තුළ වූ

(i) නිරීක්ෂණ ශක්තියත්

(ii) මනා සංයමයත්

'හානා හීය' පද්‍ය පන්තියෙන් අපූරුවට පිළිබිඹු වේ. උදාහරණ දෙක බැගින් දක්වමින් මෙම කරුණු සනාථ කරන්න. (ලකුණු 15)

- 5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පිළිතුරු සපයන්න.

5. ' 'දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල' නම් හෘදයග්‍රාහී දේශාභිමානී කාව්‍යය සාර්ථක වීමෙහි ලා කතුවරයා යොදා ගත් කාව්‍යෝපක්‍රම හේතු වී ඇත.' උදාහරණ තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

6. 'අජීවී වස්තූන්ට සජීවී බව ආරෝපණය කිරීමෙන් සහෘදයාට අපූරු රසයක් ලබා දීමට කුඩලිගම කවියා සමත් වේ.' උදාහරණ තුනක් දක්වමින් මේ බව පැහැදිලි කරන්න. (ලකුණු 10)

7. 'ලෙන අතහැර යාමට ගත් තීරණය ඇසූ මවගේත්, නැගණියගේත් ක්‍රියාකලාප හමුවේ සිංහබාහුගේ චරිතයේ සුවිශේෂී ස්වභාවයන් ඉස්මතු වේ.' උදාහරණ තුනක් දක්වමින් විමසීමක යෙදෙන්න. (ලකුණු 10)